# අමරපුර නිකාය බිහි වීමට ඉවහල් වූ පසුබිම හා ඉන් ජනිත වූ බෞද්ධ ප්‍රබෝධය සහ සමාජ සංස්කෘතික සංවර්ධනය

**බ්‍රාහ්මණවත්තේ විමලවාස හිමි**
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර
*srisumanadewa@gmail.com*

ප්‍රමුඛ පද : සරණංකර සංඝරාජ, සියම් නිකාය, අමරපුර නිකාය, මල්වතු-අස්ගිරි පාර්ශ්ව

**හැඳින්වීම**

මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ පිරිස පැමිණීමෙන් ආරම්භ වූ බුදුසමය ශ්‍රී ලාංකේය, සමාජය තුළ සීඝ්‍රයෙන් මුල්බැස ගැනීම හේතුවෙන් අනුරාධපුර හා පොළොන්නරු යුග තුළ විශාල බෞද්ධ ප්‍රබෝධයක් ගොඩනැඟිණි. මේ ලෙස සංවර්ධනීය තත්වයට පත් වූ සඟසසුන මහනුවර යුගය වන විට මහත් පරිහානියකට ලක් වීය. ආගමික වශයෙන් මෙන් ම සංස්කෘතික හා දේශපාලනික වශයෙන් සෑම ක්ෂේත්‍රයක ම මෙකී ලක්ෂණ පහළ විය. ක්‍රිස්තු වර්ෂ 1698 මැද භාගයේ අප්‍රතිහත ධෛර්යයෙන් හා නොමඳ කැපවීමෙන් වැලිවිට සරණංකර හිමියන් ක්‍රියාකිරීම නිසා විනාශ මුඛයට පත් ව තිබූ බුදුසසුන, බෞද්ධ සමාජය හා බෞද්ධාගමික පසුබිම පුනර්ජීවයට පත්විණ. එ නමුත් වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් ජීවමාන ව සිටිය දීම නැවතත් බෞද්ධ සමාජයේ පරිහානික ලක්ෂණ ප්‍රකට වන්නට විය. එක් සමාජ කොටසකට පමණක් එනම් ගොවි කුලය හැර අන්‍යයන්ට මහණ උපසම්පදාව ලබා නොදීමට මල්වතු හා අස්ගිරි පාර්ශ්වය ගත් තීරණය හේතුකොට ගෙන කුලය පදනම්කර ගෙන ශ්‍රී ලාංකේය සඟසසුන හා සමාජය කණ්ඩායම් වශයෙන් ගොඩනැඟීම ආරම්භ වූ වග පෙනෙයි. උඩරට-පහතරට භේදය ද මෙම පදනම මුල්කොටගෙන සමාජගත වූවක් බව හා ඒ වටා ගොඩනැගුණු ප්‍රවාද හා මතවාද එයට අඩුවැඩි වශයෙන් මෙකී පැවැත්මට උපකාර වන ආකාරයෙන් ඒ ඒ කණ්ඩායම් විසින් ම නිර්මාණය කරගත් බව ප්‍රඥාවෙන් බලන කළ පෙනෙන කරුණකි. මෙසේ අන්‍ය කුලවල බෞද්ධයන්ට මහණ උපසම්පදාව ලැබීමට තිබූ අයිතිය අහිමි වීමේ ප්‍රතිඵලය වූයේ "අමරපුර නිකාය" බිහිවීමයි.

ක්‍රිස්තු වර්ෂ 1766 දී බලපිටියේ දී උපත ලද **අමෙන්දියස්** නම්වූ කුල කුමරුවා බෝවල ධම්මානන්ද හිමියන්ගේ මැදිහත් වීමෙන් මහනුවර මල්වතු විහාරයට රැගෙන ගොස් වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගුරු තනතුරේ තබා පැවිද්ද ලබාගෙන මහකරාවේ ඤාණවිමල නමින් සසුන් දිවි ගෙවී ය. යථෝක්ත තීරණය හේතු කොටගෙන ඒ හිමියන්ට උපසම්පදාව ලබාගත නොහැකි විය.

**අරමුණු**

මෙම අධ්‍යයනය මගින් 19 හා 20 සියවස්වල ශ්‍රී ලංකාවේ පැවති

බුදුසසුන හා බෞද්ධ සමාජයේ පුනර්ජීවනය පිළිබඳ නව නිෂ්පාදනය කිරීම හා එකී දැනුම සමාජගත කිරීම.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමුකරන අතර අතිරේක වශයෙන් ගවේෂණ හා සම්මුඛ සාකච්ඡා යන අධ්‍යයන ක්‍රමවේද භාවිත කරනු ලැබී ය.

## අන්තර්ගතය

### අමරපුර නිකාය පිහිටුවීම සහ ව්‍යාප්තිය

මහකරාවේ ඤාණවිමල සාමණේරයන් මල්වතු විහාරයේ සිට තමන් උපන් ප්‍රදේශය වෙත වැඩම කළහ. එහි දී ඇති ව තිබෙන තත්වය හා තම අපේක්ෂාව තම නිජබිමේ දම්පතීන්ට ප්‍රකාශ කළහ. ඔවුන්ගේ උපකාරය මත ඤාණවිමල සාමණේරයන්ට ක්‍රිස්තු වර්ෂ 1800 දී වෙසක්මස පුර පසළොස්වක දින අමරපුර රාජධානියට සැපත් ව ක්‍රිස්තු වර්ෂ 1801 දී උපසම්පදාව ලබා ක්‍රිස්තු වර්ෂ 1802 දී ලක්දිවට වැඩමකිරීමත් අමරපුර නිකාය පිහිටුවා ලීමත් සමඟ ම එතැන් සිට එක පාර්ශ්වයකට පමණක් සීමා වී තිබුන මහණ උපසම්පදාව ජනසතු කිරීමත් සමඟ මහත් වූ සාසන පුනරාලෝකයක් ඇතිවිය.

මහාකරාවේ ඤාණවිමල ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නායකත්වය මත ඇරඹි අමරපුර නිකාය කාලයත් සමඟ විවිධ හේතු මුල්කරගෙන පාර්ශ්ව වශයෙන් වෙන් වී ඒ ඒ පළාත් තුළ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමසිදු විය. එහි ප්‍රතිඵලය ලෙස අදවනවිට කොටස් 22ක් මුල්බැස පවතී.

විවිධ හේතු මුල්කරගෙන පාර්ශ්ව ඇතිවීමත් සමඟ අමරපුර නිකාය විශාල සංවර්ධනයකට මංපෙත් විවර වීමට ඉඩකඩ සැළසුණි. ආගමික වශයෙන් තිබූ සීමා මායිම් නොමැති වීම නිසානන් දෙසින් පිරිසමේ සමඟ එකතු වීමෙන් කෙටිකලක් තුළ ශ්‍රී ලාංකේය සමාජය ම නියෝජනය කරන ආගමික සංවිධානයක් බවට පත් විය. මෙම ආගමික සංවිධානය හරහා පහත රට නවආලෝකයක් ඇතිවීම ද විශේෂ කරුණකි. ඒ සමගම ආගමික, අධ්‍යාපනික, කලාව හා සංස්කෘතියෙහි පුළුල් සංවර්ධනයක් ඇති වූ අතර පහතරට ප්‍රදේශවල ඇති වූ බෞද්ධ ප්‍රබෝධය මඟින් එම සමාජය තුළ ගොඩනැගුණු විවිධවත් පිළිවෙත් හා සදාචාර පද්ධතිය මඟින් සකස් වූ සමාජ සංවර්ධනය ඊට පසු කාලයෙහි පුළුල් සංවර්ධනයක් සඳහා ඉවහල් වූ බව පෙනේ.

## නිගමන

කුල අභියෝගයට මුහුණ දුන් මානවයාගේ ක්‍රියාකාරකම් හේතුකොට ගෙන 19 හා 20 වැනි සිය වස්වල දී පුළුල් සමාජ හා සංස්කෘතික සංවර්ධනයක් ගොඩනැගීමට අමර පුර නිකාය සමත් වූ බව පෙනේ. විකල්ප වශයෙන් නව නිකායන් බිහිවීම එක අතකින් සියම් නිකායේ ඇතැම් වෙනස්වීම් වලට ද තරගකාරී ලෙස මාවත විවෘත වූ බව ද පැහැදිළි ය.